## විශේෂ සටහන 11 ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2013[1]

### මූර්ත අංශය

2013 ජනවාරි 06 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ත එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 2,396 දක්වා රුපියල් 150 කින් වැඩි කරන ලදී.

2013 පෙබරවාරි 23 - බනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි වැඩි කරන ලදී.

- පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 162 දක්වා රුපියල් 3 කින්
- ඩීසල් ලීටරයක මිල රුපියල් 121 දක්වා රුපියල් 6 කින්

2013 අප්‍රේල් 01 - විදුලිබල උත්පාදනය සඳහා යොදාගන්නා දැවි තෙල්වල සිල්ලර මිල ගණන් පහත පරිදි වැඩිකරන ලදී.

- දැවි තෙල් 1,500 (අඩු සල්පර්) ලීටරයක මිල රුපියල් 100 දක්වා රුපියල් 25 කින්
- දැවි තෙල් 1,500 (වැඩි සල්පර්) ලීටරයක මිල රුපියල් 90 දක්වා රුපියල් 25 කින්
- දැවි තෙල් 3,500 (වැඩි සල්පර්) ලීටරයක මිල රුපියල් 90 දක්වා රුපියල් 25 කින්

2013 අප්‍රේල් 20 - විදුලි ගාස්තු ඒකකයක සාමාන්‍ය අගය රුපියල් 18.52 ක් වන ලෙස වැඩි කරන ලදී. ගෘහස්ත පාරිභෝගිකයන් සඳහා අදාළ නව විදුලි ගාස්තුව පහත පරිදි වේ.

| පරිභෝජනය (කිලෝවොට් පැය/මසකට) | බලශක්ති ගාස්තුව (රුපියල්/කිලෝවොට් පැය) | ස්ථාවර ගාස්තුව (රුපියල්/මසකට) | ඉන්ධන ගැලපුම් ගාස්තුව (%) |
|---|---|---|---|
| පරිභෝජනය මසකට ඒකක 0-60 ත් අතර | | | |
| 0-30 | 3.00 | 30.00 | 25 |
| 31-60 | 4.70 | 60.00 | 35 |
| පරිභෝජනය මසකට ඒකක 60 ට වැඩි | | | |
| 0-60 | 10.00 | අදාළ නොවේ | අදාළ නොවේ |
| 61-90 | 12.00 | 90.00 | 10 |
| 91-120 | 26.50 | 315.00 | 40 |
| 121-180 | 30.50 | 315.00 | 40 |
| >180 | 42.00 | 420.00 | 40 |

2014 පෙබරවාරි 02 - ග්‍රෑම් 400 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක උපරිම සිල්ලර මිල රුපියල් 386 දක්වා රුපියල් 61 කින් ද කිලෝග්‍රෑම් 1 සම්පූර්ණ යොදය සහිත කිරිපිටි පැකට්ටුවක මිල රුපියල් 962 දක්වා රුපියල් 152 කින් ද වැඩිකරන ලදී.

### විදේශ අංශය

**වෙළෙඳ සහ තීරු බදු**

2013 ජනවාරි 01 - බුල්ඩෝසර, ග්‍රේඩර්ස්, ලෙවලර්ස්, එස්කැවේටර්ස්, බලශක්ති පිරිමසින බල්බ නිෂ්පාදනය සඳහා වන අමු ද්‍රව්‍ය, අර්ධ ට්‍රේලර සඳහා වන මාර්ග ට්‍රැක්ටර්, බවුසර සහ ගිනි නිවන රථ ආනයනය එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

- සූර්ය බලශක්ති උත්පාදනය සඳහා වන සූර්ය බලශක්ති ඒකක, උපාංග හෝ සූර්ය බලශක්ති උත්පාදනය සඳහා භාවිතා කරන ගෘහස්ත පද්ධති, ගල් අඟුරු, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ඕනෑම ජාත්‍යන්තර ක්‍රීඩා උළෙලකට සම්බන්ධ භාණ්ඩ සහ ඔප දමා සකස් කරන ලද මැණික් ලෙසට පසුව විකුණනු ලබන හා විශේෂ සේවා ගාස්තුවට යටත් වන මැණික් ආනයනය කිරීම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.

[1] 2013 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම 2014 වසරේ පළමු මාස 3 තුළ දී ක්‍රියාත්මක කරන ලද සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මීට ඇතුළත් වේ.

2013 ජනවාරි 22 - විරංජනය කළ වියූ කපු රෙදි වර්ග සහ අනෙකුත් රෙදි වර්ග ආනයනය සඳහා සෙස් බද්ද පිළිවෙළින් කිලෝග්‍රෑමයට රුපියල් 75 සහ කිලෝග්‍රෑමයට රුපියල් 100 දක්වා අඩු කරන ලදී.

2013 පෙබරවාරි 08 - පහත සඳහන් ද්‍රව්‍ය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි හඳුන්වාදෙන ලදී.

| අයිතමය | බදු අනුපාතය (කිලෝග්‍රෑමයට රුපියල්) |
|---|---|
| පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් | |
| පිරිසිදු නොකළ තෙල් | 110 |
| අනෙකුත් | 115 |

2013 මාර්තු 01 - ස්වභාවය වෙනස් නොකළ ඊතයිල් මධ්‍යසාර ආනයනය කිරීම තහනම් කරන ලදී.

2013 අප්‍රේල් 03 - සුරාබදු සහ අනෙකුත් කොන්දේසිවලට යටත්ව ඊතයිල් මද්‍යසාර ආනයනය කිරීමට අවසර දෙන ලදී.

- රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු, ඖෂධ පිළියෙළ කිරීම සහ කාර්මික නිෂ්පාදන සඳහා යොදාගනු ලබන ස්ප්‍රීතු (ඊතයිල් මධ්‍යසාර) ආනයනය සඳහා සුරාබදු වැඩිකරන ලද අතර එවැනි ද්‍රව්‍ය දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ දී අදාළ වන සුරාබදු අඩු කරන ලදී.

2013 මැයි 03 - අර්තාපල් ආනයනය සඳහා වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී.

2013 ජූනි 08 - අලුත් හෝ ශීතකළ මසුන්, උම්බලකඩ, වියළි හාල්මැස්සන්, කරවළ, රතු ළූණු, බොම්බයි ළූණු, සුදු ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, මුං ඇට, කව්පි, මයිසූර් පරිප්පු, අලුත් දොඩම්, මිදි සහ ඇපල්, මිරිස්, කොත්තමල්ලි බීජ, සූදුරු බීජ, මහදුරු බීජ, කහ, උළුහාල් ඇට, කුරක්කන්, කුරක්කන් පිටි, උඳු පිටි, රටකජු, අබ ඇට, සෝයා බෝංචි තෙල්/පාම්තෙල්/ සූරියකාන්ත තෙල්/පොල් තෙල්, ටින් කරන ලද මාළු සහ උක් හෝ බීට් සීනි සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා අදාළ වන පරිදි දීර්ඝ කරන ලදී.

2013 ජූනි 21 - රත්‍රන් ආනයනය මත සියයට 5 ක තීරුබද්දක් සහ එම තීරුබද්ද මත සියයට සියයක අධිභාරයක් පනවන ලදී.

2013 ජූලි 11 - බොම්බයි ළූණු ආනයනයේ දී අයකරනු ලබන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා අදාළ වන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී.

2013 ජූලි 18 - වී හා සහල් අපනයනය සීමා කිරීම සඳහා පනවා තිබූ රෙගුලාසි අවලංගු කරන ලදී.

2013 ජූලි 31 - මධ්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ බටර් ඇතුළුව කිරි නිෂ්පාදන ආනයනයේ දී අයකරන තීරුබදු වැඩිකරන ලදී.

2013 අගෝස්තු 01 - නොඉඳුල් හයිඩ්‍රොක්ලෝරෝ ෆ්ලුවොරෝ කාබන් ආනයනය සඳහා සලාක ක්‍රමයක් හඳුන්වා දීමෙන් එම ආනයන සීමාකරන ලදී.

2013 අගෝස්තු 02 - සීනි ආනයනය සඳහා අය කරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා අදාළ වන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 27 දක්වා වැඩිකරන ලදී.

2013 අගෝස්තු 23 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි වැඩි කරන ලදී.
- අර්තාපල් කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා
- බොම්බයි ළූණු කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 35 දක්වා

2013 නොවැම්බර් 17 - පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි අඩු කරන ලදී.
- අර්තාපල් කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා
- රතු ළූණු කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා
- බොම්බයි ළූණු කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා

2013 නොවැම්බර් 22 - උම්බලකඩ, වියළි හාල්මැස්සන්, කරවල, සම්පූර්ණ-මෑ වර්ගයේ ඇට, සම්පූර්ණ-කොණ්ඩ කඩල, මුං ඇට, අළුත් දොඩම්, කොත්තමල්ලි බීජ, සුදුරු බීජ, මහදුරු බීජ, කහ, උඳු පිටි, පොතු හරින ලද රටකජු, අබ ඇට, ශුද්ධ නොකළ සෝයා බෝංචි තෙල්/පාම් තෙල්/සූර්යකාන්ත ඇටවල තෙල්, පාම් ගෙඩි මද සහ ටින් කරන ලද මාළු සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා වැඩි කරන ලදී.

- පහත දැක්වෙන භාණ්ඩ ආනයනය සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයකට අදාළ වන පරිදි හඳුන්වා දෙන ලදී.

| අයිතම | බදු අනුපාතය (කිලෝග්‍රෑමයට රුපියල්) |
|---|---|
| ලූණු | 40 |
| මාගරින් | 175 |
| යෝගට් | 625 |
| බටර් සහ කිරි නිෂ්පාදන | 880 |

- දේශීය වශයෙන් නිපදවිය හැකි අයිතම රැසක් ආනයනය සඳහා සෙස් බද්ද වැඩි කරන ලදී (ගැසට් අංක 1837/30).

- සත්ව යොදය සහිත ආහාර ද්‍රව්‍ය, මදුරු දඟර, බැටරි, සනීපාරක්ෂක තුවා, රෙදි (නොනිමි පටි ඇතුළුව) ග්‍රිල්, දැල්රෙදි, යකඩ හෝ වානේවලින් ප්‍රසාරිත වූ ලෝහ දැල් සහිත වැට කම්බි සහ ඇලුමිනියම් පොලු හා බට ආනයන මත සෙස් බදු හඳුන්වා දෙන ලදී.

- විරංජනය නොකළ රෙදි ආනයනය සඳහා අය කළ සෙස් බද්ද අඩුකරන ලදී.

- ඇලුමිනියම් කම්බි, කඩදාසි පුවරු, ටන්ග් තෙල්, ඉහළ තත්ත්වයෙන් යුතු පෑන්, ටයි පටි සහ බෝ ටයි පටි ආනයනය සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.

- ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, සාදික්කා සහ කරදමුංගු අපනයනය සඳහා සෙස් බදු හඳුන්වා දෙන ලදී.

- කාණ්ඩ හතරකින් යුත් තීරු බදු ව්‍යුහය, පහත දැක්වෙන පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගීකරණය | පෙර පැවති තීරු බද්ද (%) | නව තීරු බද්ද (%) |
|---|---|---|
| දේශීයව නිපදවනු නොලබන අත්‍යවශ්‍ය යෙදවුම් | 0 | 0 |
| අමුද්‍රව්‍ය හා අර්ධ අමුද්‍රව්‍ය | 5 | 7.5 |
| අතරමැදි භාණ්ඩ | 15 | 15 |
| නිමි භාණ්ඩ | 30 | 25 |

- තොරතුරු තාක්ෂණය ආශ්‍රිත මුද්‍රණ යන්ත්‍ර, දෘෂ්‍ය ෆයිබර් රැහැන්, සූර්ය ආරක්ෂක පටල ආනයනය තීරු බද්දෙන් නිදහස් කරන ලදී.
- පහත දැක්වෙන අයිතම ආනයනය සඳහා තීරු බද්ද අඩු කරන ලදී.

| අයිතමය | පෙර පැවති තීරු බදු අනුපාතය (%) | නව තීරු බදු අනුපාතය (%) |
|---|---|---|
| සුවඳවිලවුන්, කපුරු | 30 | 7.5 |
| උල්පත් පැන්, පන්හිඳ, ටයි පටි, බෝ ටයි පටි, ගෙල පටි, පෙට්‍රෝලියම් ජෙලි, පැරපින් ඉටි, පැඟිරි වර්ගයේ ගෙඩිවල හැර අන් ඒවායේ සගන්ධ තෙල්, ගම්මිරිස් සහ ඉඟුරුවල සගන්ධ තෙල් | 15 | 7.5 |
| කොකෝවා ඇට | 30 | 15 |
| ශීතකළ මාළු ඇම | 15 | 7.5 |

- පහත දැක්වෙන අයිතම ආනයනය සඳහා තීරු බදු හඳුන්වා දෙන ලදී.

| අයිතමය | තීරු බදු අනුපාතය (%) |
|---|---|
| තේ කර්මාන්තයට අදාළ යන්ත්‍ර සූත්‍ර, වානේ | 7.5 |
| රසකාරක | 15 |
| ඩීසල් දෙමුහුන් වාහන | 15 |
| වීල් බැරෝ සහ කොටස් | 25 |

- පහත දැක්වෙන අයිතම ආනයනය සඳහා වන තීරු බදු වැඩි කරන ලදී.

| අයිතමය | පෙර පැවති තීරු බදු අනුපාතය (%) | නව තීරු බදු අනුපාතය (%) |
|---|---|---|
| ට්‍රැක්ටර්, සිමෙන්ති | 5 | 7.5 |
| ගෝස්, විනෝද හෝ ක්‍රීඩා කටයුතු සඳහා වූ යැව් සහ අනෙකුත් යාත්‍රා | 15 | 25 |

- රත්‍රන් ආනයනය සඳහා අය කළ තීරු බද්ද සියයට 5 සිට සියයට 7.5 දක්වා වැඩි කරන ලද අතර තීරු බද්ද මත පනවා තිබූ සියයට 100 ක අධිභාරය ඉවත් කරන ලදී.
- ගුවන් යානා ඉන්ධන ආනයනය වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.
- ආයුර්වේද ශාබසාර සම්මිශ්‍රණ ආනයනය සඳහා සියයට 5 ක වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දක් පනවන ලදී.
- පහත දැක්වෙන අයිතම ආනයනය සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

| අයිතමය | පෙර පැවති නිෂ්පාදන බදු අනුපාතය | නව නිෂ්පාදන බදු අනුපාතය |
|---|---|---|
| පෙට්‍රල් | ලීටරයට රුපියල් 25 | ලීටරයට රුපියල් 27 |
| ඩීසල් | ලීටරයට රුපියල් 2.50 | ලීටරයට රුපියල් 3 |
| ලොරි, ට්‍රක් රථ | ඒකකයට රුපියල් 109,000 | සියයට 14 හෝ ඒකකයට රුපියල් 109,000 |
| ත්‍රීරෝද රථ | සියයට 45 | සියයට 53 |

2014 පෙබරවාරි 03

- කිරිපිටි ආනයනයේ දී ලබාදී තිබූ තීරුබදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 18 සිට කිලෝග්‍රෑමයට රුපියල් 68 දක්වා වැඩි කරන ලදී. ඒ අනුව, කිරිපිටි සඳහා අදාළවන තීරුබදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 57 කි.

2014 පෙබරවාරි 06 - පියළි කළ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 22 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී.

2014 පෙබරවාරි 07 - අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මාස පහක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී.

**විදේශ විනිමය කළමනාකරණය**

2013 ජනවාරි 01 - විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) ජංගම, ඉතුරුම් හෝ කාලීන තැන්පතු ආකාරයෙන් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් විවෘත කළහැකි බව බලයලත් වෙළෙඳුන් වෙත දැනුම් දෙන ලදී.

- විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) යටතේ ඇපයෙන් සීමිත හෝ අක්වෙරළ සමාගම් හැර ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්වලට ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් එ.ජ.ඩොලර් මිලියන 30 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන උපරිම වටිනාකමක් දක්වා ණය ලබාගැනීමට පොදු අවසරයක් ලබාදුන් අතර ලබාගත හැකි උපරිම ණය මුදල ලිත් වර්ෂයකට එ.ජ.ඩොලර් මිලියන 10ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වන ප්‍රමාණයක් වේ.
- ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයින්ට සපයන ලද භාණ්ඩ හා සේවාවලට අදාළ ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් භාර ගැනීමට පොදු අවසරය ප්‍රදානය කරන ලද අතර, එකී විදේශ ව්‍යවහාර මුදල් භාරගත් පුද්ගලයා විසින් දින 7 ක් ඇතුළත පහත ආකාරයකින් සිය සන්තකයෙන් බැහැර කළයුතු වේ.
  - බලපත්‍රලාභී වාණිජ බැංකුවක එකී විදේශ ව්‍යවහාර මුදල් භාරගත් පුද්ගලයාගේ නමින් විවෘත කර පවත්වාගෙන යන විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක තැන්පත් කිරීම හෝ
  - බලපත්‍රලාභී වාණිජ බැංකුවකට විකිණීම

2013 ජනවාරි 02 - සුරැකුම්පත් ආයෝජන ගිණුම් (SIA) හිමි පුද්ගලයෙකුට ඔහුගේ ගිණුමේ ඇති මුදල් ඔහුගේම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (NRFC), විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුමකට (SFIDA), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (RNNFC) හෝ අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (NRNNFA) මාරු කිරීම් සඳහා අවසර ලබාදෙන ලදී.

- බලයලත් වෙළෙඳුන්ට ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමග ඉදිරි ගිවිසුම්වලට එළඹීමට අවසර ලබාදෙන ලදී. එමඟින් ගණුදෙනුකරුවන්ට ඇතිවන විනිමය අවදානම ආවරණය කර ගැනීමට හැකිවනු ඇත.

2013 ජනවාරි 04 - 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත අනුව විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යාපාර ආයතනයක් ලෙස වර්ගීකරණය කර ඇති සමාගමක ශ්‍රී ලංකා රුපියල් වලින් නාමනය කර ඇති ගෙවා නිදහස් කළහැකි වරණීය කොටස්, අනුමත කළ රටක අරමුදල්වලට, ප්‍රාදේශීය අරමුදල්වලට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාපිත ආයතනවලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට (ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන් ද ඇතුළත්ව) නිකුත් කිරීම සහ පැවරීම සඳහා නිශ්චිත කොන්දේසිවලට යටත්ව පොදු අවසරය ප්‍රදානය කරන ලදී.

2013 ජනවාරි 10 - විදේශීය සමාගම් විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථාන ආරම්භ කිරීම පිළිබඳ 2010.11.22 දිනැති අංක 1681/10 දරන ගැසට්පත්‍රයේ සඳහන් කර ඇති "ආමුඛ ආයෝජන ගිණුම (IIA)" යන වචන වෙනුවට "සුරැකුම්පත් ආයෝජන ගිණුම" යන වචන ආදේශ කරන ලදී.

2013 ජනවාරි 23 - ආමුඛ ආයෝජන ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද විධානය අවලංගු කරන ලද අතර, එම විධානය යටතේ විවෘත කර ඇති ගිණුම් ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යා හැකි බව බලයලත් වෙළෙඳුන් හට දැනුම් දෙන ලදී.

**2013 ජනවාරි 24**

- විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවෙකු විසින් ලබාගන්නා ලද ණය මුදල් එකී ණය ගැනුම්කරු විසින් එම අරමුණ සඳහා ම විවෘත කරන ලද විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් ද ඇතුළුව එකී ණය ගැනුම්කරු විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ඕනෑම බැංකු ගිණුමකට බැර කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අවසර ලබා දෙන ලදී. තවද, විදේශීය ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීම සහ වෙනත් අදාළ වියදම් හා ගාස්තු සම්බන්ධයෙන් බාහිර ප්‍රේෂණයන් සිදු කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදෙන ලදී.
- විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය මුදල් ඕනෑම බැංකු ගිණුමකට බැර කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදුන් අතර ඒ සම්බන්ධයෙන් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් (ECBA) විවෘත කළයුතු යැයි පැවති අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

**2013 ජනවාරි 30**

- අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට හිමි, ශ්‍රී ලංකාව තුළ පිහිටි දේපළ මිලදී ගැනීමේදී එම ප්‍රතිෂ්ඨාව ශ්‍රී ලංකා රුපියල් වලින් අනේවාසික ශ්‍රී ලාංකිකයන්ට ගෙවීම සඳහා ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට ලබාදී තිබූ පොදු අවසරය සහ ශ්‍රී ලංකාව තුළ පිහිටි තමන්ට හිමි දේපල විකුණනු ලබන අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ නමින් සංක්‍රමණික ආවෘත ගිණුම් විවෘත කිරීම සඳහා බලයලත් වෙළඳුන්හට ලබා දී තිබූ අවසරය ශ්‍රී ලාංකික සම්භවයක් ඇති අනේවාසික පුද්ගලයන් දක්වා දීර්ඝ කරන ලදී.

**2013 ජනවාරි 31**

- විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ආයෝජකයන්ට (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකිකයන් ද ඇතුළත්ව) නිශ්චිත කොන්දේසිවලට යටත්ව ඒකක භාරයක ඒකකයන්හි ආයෝජනය කිරීමට පොදු අවසරය ප්‍රදානය කරන ලදී.

**2013 අප්‍රේල් 29**

- අන්තරාල වෙළෙඳාම සඳහා භාණ්ඩ ආනයනය සහ අපනයනය වෙනුවෙන් වන ඉල්ලීම් සඳහා නිශ්චිත කොන්දේසිවලට යටත්ව පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන්හට අවසරය ලබාදෙන ලදී.

**2013 ජුනි 12**

- වෙනත් රටක නිත්‍ය නේවාසික (PR) පිටසන ඇතුළත්, වලංගු ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රයක් දරණ තනි පුද්ගල විගාමිකයෙකුට මූලික සංක්‍රමනික දීමනාව වශයෙන් එ.ජ.ඩොලර් 150,000 දක්වා වන මුදලක් නිකුත් කිරීමට/පැවරීමට බලයලත් වෙළෙඳුන්ට අවසර ලබාදෙන ලදී. තවද, විගාමික සංවෘත ගිණුමින් (MBA) එම ගිණුම් හිමියාගේ උපදෙස් පරිදි අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට මුදල් මාරු කිරීමට අවසර ලබා දෙන ලදී.
- වෙනත් බලයලත් වෙළෙන්දෙකු වෙත පවත්වාගෙන යනු ලබන නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් මාරු කරන ලද මුදල් භාවිතාකොට ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එම පුද්ගලයා වෙනුවෙන් නව නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදෙන ලදී.
- බලයලත් වෙළෙඳුන්හට ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බැංකුවල හෝ එවැනි බැංකුවල ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත ශාඛාවල Nostro ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වා ගෙනයාමට අවසරය ලබාදෙන ලදී.
- ආයෝජන අරමුණ සඳහා ශ්‍රී ලංකාව තුළට ලැබෙන ආමුඛ ප්‍රේෂණයන්ට පහසුකම් සැලසීමේ මාර්ගයක් ලෙස, සුරැකුම්පත් ආයෝජන ගිණුමට අරමුදල් ලැබීම් සහ එම ගිණුම්වලින් අරමුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීම සඳහා වඩාත් නම්‍යශීලී ප්‍රවේශයක් සැලසීම පිණිස සුරැකුම්පත් ආයෝජන ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගැනීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.
- එතෙර සංචාරය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා වූ සංචාරක දීමනාවේ කොටසක් ලෙස එ.ජ.ඩොලර් 5,000 ක් හෝ වෙනත් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍යවන ප්‍රමාණයක නෝට්ටු නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන්හට අවසර ලබාදෙන ලදී.

| | |
|---|---|
| | - අනේවාසිකයින් විසින් ජාත්‍යන්තර බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද මුදලින් අත්පත් කර ගත් සහ/හෝ සංවර්ධනය කරන ලද නිශ්චල දේපලක් විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලාභ ද ඇතුළු සම්පූර්ණ මුදල ප්‍රතිමුඛ ප්‍රේෂණය සඳහා පොදු අවසරය ලබා දෙන ලදී. |
| | - විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන පුද්ගලයන්ට දේශීය බැංකු ඒකක වෙතින් විදේශීය මුදලින් ණය ලබාදීමට අවසර ලබාදෙන ලදී. |
| | - විගාමික සංවෘත ගිණුමෙන්, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අරමුදල් මාරු කිරීමට සහ වෙනත් බලයලත් වෙළෙන්දෙකු වෙත පවත්වාගෙන යනු ලබන අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් මාරු කරන ලද මුදල් භාවිතා කොට ඕනෑම අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එම පුද්ගලයා වෙනුවෙන් නව අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී. |
| | - 2010.03.11 දිනැති අංක 1644/26 දරන ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති සුදුසුකම් ලත් පුද්ගලයන්ට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබූ අවසරය වෙනත් රටක වලංගු නිත්‍ය නේවාසික බලපත්‍රයක් ලබාගෙන ඇති පුද්ගලයන් හා ද්විත්ව පුරවැසිභාවය ඇති පුද්ගලයන් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2013 ජූනි 17 | - විනිමය පාලන රෙගුලාසිවලට අනුගතවීම සහතික වීම සඳහා ඒ වෙනුවෙන් වගකිවයුතු අනුකූලතා නිලධාරියෙකු පත් කරන ලෙස බලයලත් වෙළෙඳුන්හට දැනුම් දෙන ලදී. |
| 2013 අගෝස්තු 26 | - ශ්‍රී ලංකා රජය විසින් 2010, 2011 සහ 2012 වර්ෂවල දී ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳපොළේ දී අත්පත් කර ගැනීමට, රඳවා ගැනීමට සහ පැවරීමට බලයලත් වෙළෙඳුන් වෙත අවසරය ලබාදෙන ලදී. |
| 2013 ඔක්තෝබර් 21 | - ශ්‍රී ලංකාව තුළ කටයුතු කරනු ලබන විදේශ නැව් සේවා හා ගුවන් සේවා නියෝජිතයන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, "විදේශ නැව් සේවයක හෝ ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම" (FCAASA) ලෙස නැවත නම් කරන ලද අතර විදේශ නැව් සේවයක හෝ ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන එම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අදාළ නව නියමයන් හා කොන්දේසි නිකුත් කරන ලදී. |
| **අපේක්ෂිත** | - සංස්ථාපිත ණය වෙළෙඳපොළ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම පිණිස අනේවාසිකයන්හට ආයෝජනය කිරීම සඳහා අවසර ලබාදෙන උපකරණ වැඩි කිරීම. |
| | - විදේශ විනිමය උපයන සමාගම්වලට එම සමූහයේම වෙනත් සමාගම්වලට විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබාදීම පිණිස අවසර ලබාදීම. |
| | - අනේවාසිකයන් විසින් දේපළවල බදු අයිතීන් අත්පත් කර ගැනීම සඳහා පහසුකම් සැලසීම. |
| | - විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් සඳහා ඕනෑම කාර්යයක් වෙනුවෙන් ණය පහසුකම් ප්‍රදානය කිරීම සඳහා අවසර ලබාදීම. |
| | - විශේෂ යෝජනා ක්‍රමයන් යටතේ හඳුන්වා දෙනු ලැබූ ගිණුම් සරල කිරීම. |
| | - විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් සඳහා පවතින අවම තැන්පතු සීමාව ඉවත් කිරීම. |
| | - සංචාරක කාඩ්පත් නිකුත් කිරීම සඳහා පොදු අවසරය ලබාදීම. |
| | - ශිෂ්‍ය වීසා ලබා ගැනීමේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අරමුදල් ප්‍රේෂණය කිරීම. |
| | - භාණ්ඩ නැව්ගත කරන්නන්හට විනිමය පාලන දෙපාර්තමේන්තුව සමග ලියාපදිංචි වීම සඳහා පවතින අවශ්‍යතාවය ඉවත් කිරීම. |
| | - නව එතෙර ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමේ පවතින අරමුදල් භාවිතා කිරීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු සමාගම් සඳහා අවසර ලබාදීම. |

## රාජ්‍ය මූල්‍ය අංශය

**රාජ්‍ය ආදායම**

2013 ජනවාරි 01

- 2003 අංක 03 දරන මූල්‍ය කළමණාකරණ (වගකීම) පනත සංශෝධනය කරන ලදී.
- පහත සඳහන් ආයතන මගින් කරනු ලබන සැපයීම් හා පිරිවැටුම එකතුකළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
  - මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුව
  - පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජය මැදිහත්වීමෙන් ගනු ලැබූ ණය මුදලකින් රජය වෙනුවෙන් නොමිලේ සේවාවන් සලසන ඕනෑම රාජ්‍ය සංස්ථාවක්
- ඒකක භාර කළමනාකරණ සමාගමක් විසින් ඒකක භාරයක් වෙත කරනු ලබන සේවා සැපයීම්, එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- ක්‍රීඩා ඉසව්වකට හෝ ක්‍රීඩාවක් සම්බන්ධ කටයුත්තකට සහභාගි වීම සඳහා ලංකාවට පැමිණෙන යම් ක්‍රීඩකයකුට, ක්‍රීඩා සංවිධායකයෙකුට හෝ ක්‍රීඩා අනුග්‍රාහකයකුට හෝටලයක නැවතීමේ පහසුකම් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- පොල් ආශ්‍රිත ඉවතලන ද්‍රව්‍ය මගින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන් (කොහුබත්, කොහු කෙඳි, බීජ තවාන් මළු, වගා මළු, කොහු කඹ, පොල්ලෙලි) එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- තොග සහ සිල්ලර වෙළෙඳාම සඳහා එකතු කළ අගය මත බද්ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව කාර්තුවක් සඳහා රුපියල් මිලියන 500 ට වැඩි පිරිවැටුමක් සහිත තොග හෝ සිල්ලර වෙළෙඳාමේ සහ සැපයුම්වල (නිදහස් හෝ ඉවත් කරන ලද සැපයුම් ද සහිතව) නිරත තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි විය යුතු වේ. කෙසේ නමුත්, එකතු කළ අගය මත බද්ද අදාල වනුයේ බදුවලට යටත් සැපයුම්වලට පමණක් වේ.
- යම් තැනැත්තෙකු විසින් කොටස් පැවරීමේ නීතිමය සාධන පත්‍රයක් අන්තර් වෙළෙඳ ගිණුමකට (ස්ලැස් ගිණුමකට) මාරුකිරීම හෝ එය ප්‍රතිලෝම වශයෙන් සිදුවීම මුද්දර ගාස්තුවෙන් නිදහස් කරන ලදී.
- පහත සඳහන් සාධන පත්‍ර සඳහා මුද්දර ගාස්තුව වැඩි කරන ලදී.

| සාධන පත්‍රය | පැවති ගාස්තුව | නව ගාස්තුව |
|---|---|---|
| දිවුරුම් පෙත්සම | රුපියල් 25 | රුපියල් 250 |
| රක්ෂණ ඔප්පු | ඔප්පුව මත ගෙවිය යුතු වාරිකවල එකතුව මත සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසකට රුපියල් 0.50 බැගින් | ඔප්පුව මත ගෙවිය යුතු වාරිකවල එකතුව මත සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසකට රුපියල් 1 බැගින් |
| නොතාරිස් බලපත්‍රය | රුපියල් 1,000 | රුපියල් 2,000 |
| වෙළෙඳ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍රය | රුපියල් 1,000 හෝ බලපත්‍ර ගාස්තුවෙන් සියයට 10 යන දෙකින් අඩු අගය | රුපියල් 2,000 හෝ බලපත්‍ර ගාස්තුවෙන් සියයට 10 යන දෙකින් අඩු අගය |
| මධ්‍යසාර විකිණීමේ ව්‍යාපාරයක් කරගෙන යාමට නිශ්චිත කාලයක් සඳහා දෙනු ලබන බලපත්‍රය | රුපියල් 10,000 | රුපියල් 20,000 |
| ණය කාඩ්පත් ගනුදෙනු පියවීම | සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසක රුපියල් 10 බැගින් | සෑම රුපියල් 1,000 ට හෝ ඉන් කොටසක රුපියල් 15 බැගින් |

- ගුවන් තොටුපොළෙන් පිටවීමේ බද්ද එ.ජ.ඩොලර් 10 සිට එ.ජ.ඩොලර් 25 දක්වා වැඩි කරන ලද අතර අන්තර්ජාලය හරහා වීසා ලබා ගැනීමේ ගාස්තුව එ.ජ.ඩොලර් 5 කින් වැඩි කරන ලදී.
- අධිවේගී අන්තර්ජාල පහසුකම් සඳහා දැනට පවතින විදුලි සංදේශ බද්ද සියයට 20 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී.
- ඔට්ටු සහ සූදු ව්‍යාපාරය සඳහා පැවති බදු ව්‍යුහය වෙනස් කර සියලුම වක්‍ර බදු වෙනුවට දළ ආදායම මත සියයට 5 ක බද්දක් හඳුන්වා දෙන ලදී.
- ඔට්ටු සහ සූදු ව්‍යාපාරය සඳහා ලියාපදිංචි ගාස්තු පිළිවෙළින් රුපියල් මිලියන 2 දක්වා සහ රුපියල් මිලියන 100 දක්වා වැඩි කරන ලදී.
- අපනයනාභිමුඛ සමාගම් තම නිෂ්පාදන භාණ්ඩ දේශීය වෙළෙඳපොළේ අලෙවි කිරීමේ දී අයකරන බදු පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - නිමි ඇඳුම් හෝ පිගන් භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන අපනයනාභිමුඛ ව්‍යාපාරයක පිරිවැටුම මත අය කෙරෙන සියලුම වක්‍ර බදු වෙනුවට එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට යටත්ව සිය දේශීය විකුණුම්, සියයට 40 ක් දක්වා වැඩි කිරීමට අවසර ලබාදෙන ලදී.
  - කැලි මත බදු අය කිරීමේ ක්‍රමයට එක් කොටසකට රුපියල් 25 බැගින් වූ බද්ද ඉවත් කරන ලදී.
  - නිෂ්පාදන භාණ්ඩ විකුණුම්වලින් ලැබෙන ලාභ සහ ආදායම් මත ආදායම් බද්ද (අපනයනයන් මෙන්ම දේශීය වෙළෙඳපොළෙහි විකුණුම් සඳහා) සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් කරන ලදී.
- යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරගෙන යනු ලබන සියලු ව්‍යාපාරවල වාර්ෂික පිරිවැටුම/සැපයුම් රුපියල් මිලියන 12 නොඉක්මවන විට, එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද (තොග හෝ සිල්ලර ව්‍යාපාරයක ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළත්ව) ගෙවීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලදී.
- මෝටර් වාහන වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව වැඩි කරන ලදී.

2013 ජනවාරි 09

- මූල්‍ය පනතේ විශේෂ වරප්‍රසාද යටතේ බදු ගෙවන්නකු විසින් මෝටර් රථයක් ආනයනය කිරීමේ දී බලපවත්නා එන්ජින් ධාරිතා සීමාව (1,600 CC) ඉවත් කරන ලදී.

2013 අප්‍රේල් 01

- පහත දැක්වෙන ආයතනයන්හි ලාභ සහ ආදායම් (ලාභාංශ හා පොලී ආදායම් හැර) ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වෛද්‍යවරුන්ගේ ආයතනය
  - ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
  - ඒකාබද්ධ අරමුදලින් හෝ රජය මැදිහත් වී ලබාදෙන ණය මුදලකින් ඕනෑම රාජ්‍ය සංස්ථාවක් විසින් නොමිලේ සපයනු ලබන සේවාවන්
  - ජාතික සංවර්ධන භාර අරමුදල සමග ඒකාබද්ධ කර ඇති ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව
  - සීමාසහිත ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව
  - අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති සහ එම අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සහ චක්‍රලේඛ අනුගමනය කිරීමට යටත් වන රජයේ සහාය ලබන ඕනෑම පෞද්ගලික පාසලක්
- පහත සඳහන් ක්‍රියාකාරකම් තුළින් ලබන ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - එක් රටකින් ලබාගත් භාණ්ඩ ශ්‍රී ලංකාව හැර වෙනත් රටකට ප්‍රවාහනය කරන අක්වෙරළ ව්‍යාපාරයක්
  - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි කළ එ.ජ.ඩොලර් මිලියන 50 ක් ඉක්මවා සෘජු විදේශීය ආයෝජන සිදු කර ඇති සමාගමක් විසින් බදු සහන කාලසීමාව තුළ දී විදේශීය දායකයෙකු වෙත ගෙවනු ලබන රාජ්‍ය භාග, වරලත් නියෝජිත ගාස්තු හෝ මෝස්තර නිර්මාණය සඳහා කරන ලද ගෙවීම්

- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ සහ සමාගම් පනත යටතේ ස්ථාපනය නොකරන ලද රජයේ සහාය ලබන ඕනෑම පෞද්ගලික පාසලක්
- ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ ආයෝජනය මුළුමනින්ම සෘජු විදේශීය ආයෝජන මගින් සිදු කර ඇති එ.ජ.ඩොලර් මිලියන 50 ක් ඉක්මවා ආයෝජන සිදු කළ ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත සමාගමක් විසින් බදු නිදහස් කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ගෙන්වන ලද විශේෂඥයකු වන පුද්ගලයකුගේ ශ්‍රී ලංකාව තුළ දී උද්ගත වූ පාරිශ්‍රමික වලින් ලද ආදායම
- ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තකුගෙන් ලබාගත් ණයවලින් ඉපැයූ ආදායම
- පුනර්ජනනීය බලශක්ති නිපදවීම සඳහා යොදාගන්නා බෝග කෘෂිකාර්මික ඉඩම්වල වගා කිරීමෙන් ලැබූ ලාභ සහ ආදායම්

- ශ්‍රී ලාංකික පුරවැසියන්ට ශ්‍රී ලංකාවෙන් පිටත කළ ඉපැයීම් සඳහා පහත සඳහන් බදු සහන හඳුන්වා දෙන ලදී.
  - දින 365 කට වැඩි අඛණ්ඩ දින ගණනක් ලංකාවෙන් පිටත සිටීම පදනම් කරගෙන පුද්ගලයකුගේ වාසික භාවය තීරණය වූ රීතිය ඉවත් කර ඒ වෙනුවට දින 183 ක රීතිය හඳුන්වා දෙන ලදී.
  - යම් පුද්ගලයකු ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රභවයකින් ලබාගත් ලාභ සහ ආදායම් බැංකුවක් හරහා ප්‍රේෂණය කර ඇත්නම් එම ආදායම ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපයාගත් ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ලබාදෙන බදු නිදහස, ශ්‍රී ලංකාව සහ වෙනත් රටක පුරවැසිභාවය ලබා සිටින වෙනත් ඕනෑම රටක ස්ථිරව පදිංචි වී ඇති පුද්ගලයන් සඳහා ද ලබාදෙන ලදී.

- පහත සඳහන් අංශ සඳහා සහනදායී බදු අනුපාතයන් හඳුන්වා දෙන ලදී.
  - ඒකක භාර කළමනාකරණ සමාගම් සඳහා සියයට 10 ක බදු අනුපාතයක්
  - ගුවන් නියමුවන්ගේ සේවා නියුක්ති ලාභ සහ ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින් වෙත වෘත්තීමය සේවාවන් සපයනු ලබන සුදුසුකම් සහිත සේවා නියුක්තිකයන්ට අදාල ආදායම් සඳහා සියයට 16 ක බදු අනුපාතයක්
  - සේවානියුක්තිය අහිමි වීම සම්බන්ධයෙන් වන්දි මුදලක් ලෙස ගෙවනු ලබන සේවානියුක්ති ආදායම සඳහා සියයට 16 ක බදු අනුපාතයක්
  - කුකුලන් ඇති කිරීම මගින් ලැබෙන ලාභ සඳහා සියයට 10 ක බදු අනුපාතයක්
  - විදේශීය නැව් සඳහා ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ සැපයීම හෝ සේවාවන් සැපයීම සඳහා විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම් අපනයන ලෙස සලකන අතර එමගින් ලබාගන්නා ලාභ සහ ආදායම් සඳහා සියයට 12 ක සහනදායී බදු අනුපාතයක්
  - ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ හෝ සේවා අපනයනය කිරීමෙන් ලැබූ ලාභ හා ආදායම් සම්බන්ධයෙන් සියයට 12 ක සහනදායී බදු අනුපාතයක්
  - "කාබනික තේ තොග" සාම්ප්‍රදායික නොවන භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඒ සඳහා සියයට 12 ක බදු අනුපාතයක්
  - කුඩා ප්‍රමාණයේ ජල විදුලි ව්‍යාපෘතියක් හෝ වෙනත් විකල්ප බලශක්ති ප්‍රභවයක් තුළින් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් ලබන ලාභ සහ ආදායම් සඳහා සියයට 12 ක බදු අනුපාතයක්

| | | |
|---|---|---|
| | - | පහත සඳහන් කර්මාන්ත සහ ක්‍රියාකාරකම්වල ලාභය ගණනය කිරීමේ දී ඒවායේ පිරියත, යන්ත්‍ර හෝ උපකරණ මිලදී ගැනීමේ පිරිවැය, ක්ෂයවීම් දීමනාවක් ලෙස අඩුකිරීමට ඉඩ ලබාදෙන ලදී. |

| කර්මාන්ත/ක්‍රියාකාරකම් | අවසර දෙනු ලබන අනුපාතය |
|---|---|
| තාක්ෂණය ඉහළ නැංවීම හෝ නව තාක්ෂණය හඳුන්වා දීම | වසරකට සියයට 50 |
| මුළු බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 30 කට වඩා විකල්ප බලශක්ති ප්‍රභවයන්ගෙන් සපයා ගැනීම | සියයට 100 |
| කොළඹ කොටස් හුවමාරුවේ අවශ්‍යතාවයන්ට අනුගතව Broker Back Office System ඇති කිරීම | සියයට 100 |
| ඕනෑම අපනයන කර්මාන්තයක් | වසරකට සියයට 50 |

| | | |
|---|---|---|
| | - | රජයේ ආයතන හරහා පර්යේෂණ හා වැඩිදියුණු කිරීම් සිදුකර ගැනීමේ දී දරන ලද වියදම මෙන් තුන්ගුණයක් බදු අය කළහැකි ආදායමෙන් අඩු කිරීමට ලබාදී තිබූ සහනය පර්යේෂණ සඳහා පෞද්ගලික ආයතන දරන පිරිවැය සම්බන්ධයෙන් ද ලබාදෙන ලදී. |
| | - | කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත බැඳුම්කර හා ණයකරවල ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | ආදායම් බදුවලට අදාළව දැනට පවත්නා බදු වාර්තා ලබාදීම සඳහා ඇති අවුරුදු දෙකක කාල කඩඉම මාස දහ අටක් දක්වා අඩු කරන ලදී. |
| | - | ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් කරන ලදී. |
| 2013 මැයි 13 | - | දිවුරුම් පෙත්සම් සඳහා වූ මුද්දර ගාස්තුව රුපියල් 250 සිට රුපියල් 50 දක්වා අඩු කරන ලදී. |
| 2013 ජූලි 31 | - | දුම්කොළ, සිගරට් සහ මෝටර් රථ සඳහා වූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී. |
| 2014 ජනවාරි 01 | - | විදුලි සංදේශ කර්මාන්තයේ උසස් තාක්ෂණික උපකරණ සඳහා භාවිතා කරන තඹ කම්බි ආනයනය හෝ දේශීයව මිල දී ගැනීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගලි බවුසර්, මාර්ග ට්‍රැක්ටර් සඳහා යොදා ගන්නා අර්ධ ට්‍රේලර්ස්, යන්ත්‍ර සහ උපකරණ ආනයනයේ දී ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස දේශීය නිෂ්පාදකයින්ගෙන් මිල දී ගත් විට ද ලබා දෙන ලදී. |
| | - | ටයි පටි සහ බෝ ටයි පටි, උසස් තත්ත්වයෙන් යුත් පෑන්, ශීත කළ මාළු ඇම, බිලී පිති/ බිලී කොකු/ මාළු බාන යොත්, මාළු බාන රෝද සහ නාවික ධාවන එන්ජින් ආනයනය හෝ සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. |
| | - | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද ගෙවීමට යටත් භාණ්ඩ සඳහා දැනට පවතින එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්, කවර හෝ ලිත් වර්ෂයක යම් මාස තුනක කාලසීමාවක ආනයනය කොට දේශීය වෙළෙඳපොළට සපයන ලද සැපයුම රුපියල් මිලියන 250 නොඉක්මවන සැපයුම් වටිනාකමක් ඇති ආනයනකරුවකුට පමණක් වන ලෙස සීමා කරන ලදී. |
| | - | පහත සඳහන් භාණ්ඩ ආනයනය හෝ සැපයුම් මත ලබාදුන් එකතු කළ අගය මත බදු නිදහස ඉවත් කර සියයට 12 ක බදු අනුපාතය හඳුන්වා දෙන ලදී.<br>- අමු තේ දළු, හාල්පිටි, තිරිඟු පිටි, පාන්, බිත්තර, දියර කිරි හෝ කිරිපිටි, ඇතුලත්ව වී, සහල්, තිරිඟු, කරදමුංගු, කුරුඳු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ගම්මිරිස්, කපාපු පොල්, රබර්, රබර් කිරි, අමු පොල්, තේ<br>- කෘෂිකාර්මික ට්‍රැක්ටර්, හෝ අර්ධ ට්‍රේලර් සඳහා වූ මාර්ග ට්‍රැක්ටර්<br>- තේ හා රබර් කර්මාන්තය සඳහා යොදාගනු ලබන යන්ත්‍ර සහ උපකරණ<br>- කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා යොදාගනු ලබන යන්ත්‍ර |

- බදු විරාම ලැබීමට සුදුසුකම් ලැබූ ව්‍යවසායයන් සඳහා වූ පිරියත හා යන්ත්‍ර උපකරණ
- ඖෂධ සැකසුම්

- තොග සහ සිල්ලර වෙළෙඳාමට එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු කාර්තුවක් සඳහා විකුණුම් වටිනාකම රුපියල් මිලියන 500 සිට රුපියල් මිලියන 250 දක්වා අඩුකරන ලදී.
- එකතු කළ අගය මත බද්දට යටත් වන සැපයුම් හා බදු නිදහස් සැපයුම් තොග හා සිල්ලර වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති විට බදු නිදහස අදාළ වන භාණ්ඩ සැපයුම, මුළු සැපයුමෙන් සියයට 25 කට සීමා කරන ලදී.
- පහත සඳහන් අයිතමයන් ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
  - තීරු බදු රහිත වෙළෙඳසල්වල කරනු ලබන සිල්ලර වෙළෙඳාම
  - දේශීයව නිෂ්පාදනය කරන ලද පොල් තෙල් නිෂ්පාදකයා විසින් විකිණීම වර්ෂ තුනක කාලයක් සඳහා
  - එල් පී ගෑස් බෙදාහැරීම
  - විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා ගුවන්තොටුපොළක කරනු ලබන සේවා සැපයුම
- විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දට යටත් භාණ්ඩ සඳහා වන ජාතිය ගොඩනැගීමේ බදු නිදහස රේගුවේ දී ගෙවිය යුතු බද්දට සීමා කරන ලදී. ඒ අනුව එවැනි භාණ්ඩවල දේශීය සැපයුම ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් වේ.
- ආයෝජන අරමුදල් ගිණුමෙහි අරමුදල් තැන්පත් කිරීමෙහි අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමග මූල්‍ය සේවා ජාතිය ගොඩනැගීමේ බද්ද නැවත අදාළ කරන ලදී.
- ට්‍රැක්ටර් විකිණීමෙන් ලැබෙන පිරිවැටුම ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කිරීම දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද ට්‍රැක්ටර් සඳහා පමණක් ලබාදෙන ලදී.
- ඖෂධ සැකසුම් ආනයනය ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කරන ලදී.
- දැනට පවත්නා සියයට 20 ක විදුලි සංදේශ බද්ද සියයට 25 ලෙස සංශෝධනය කරන ලදී. තොරතුරු තාක්ෂණය හා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශ්වයන්ට පැවරීමේ අංශයන් දිරිමත් කිරීම සඳහා අන්තර්ජාල සේවාවන්/බ්‍රෝඩ් බෑන්ඩ් සේවාවන් හරහා සිදු කරනු ලබන සේවාවන් සඳහා වූ සියයට 10 ක සහනදායී බදු අනුපාතය නොවෙනස්ව පවතී.

**අපේක්ෂිත**

2014 අප්‍රේල් 01

- පහත සඳහන් ආයතනයන්හි ලාභ සහ ආදායම් (ලාභාංශ සහ පොලී ආදායම් හැර) ආදායම් බද්දෙන් නිදහස් කෙරේ.
  - 2006 අංක 17 දරන ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය
  - 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතන පනත යටතේ සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය
  - 1986 අංක 12 දරන ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතන පනත යටතේ සංස්ථාගත ශ්‍රී ලංකා භෞතික විද්‍යා ආයතනය
- ශ්‍රී ලංකාවෙන් පිටත ඉපයූ ලාභ සහ ආදායම් සඳහා ලබාදෙනු ලබන සහනදායී ආදායම් බදු අනුපාතයන් පහත පරිදි වේ.
  - ඇඟලුම් අපනයනකරුවන්ට සපයනු ලබන විවිධ සේවාවන්ගෙන් ලැබෙන ලාභ හා ආදායම් මත දැනට අදාළ වන සහනදායී බදු අනුපාතය වූ සියයට 12, භාණ්ඩ හා සේවා අපනයනකරුවන්ට, හෝ ඍජුවම විදේශීය ප්‍රධානියාට සේවා සැපයීම තුළින් ලැබෙන ලාභ සඳහා ද ලබාදෙන ලදී.
  - සුදුසුකම් ලැබූ අපනයන සඳහා දැනට පවත්නා සියයට 10ක බදු අනුපාතය සියයට 12ක් ලෙස සංශෝධනය කෙරෙනු ඇත.
  - රුපියල් මිලියන 500 නොඉක්මවන පිරිවැටුමක් ඇති ව්‍යවසායන් සඳහා දැනට පවත්නා සියයට 10 ක බදු අනුපාතය සියයට 12 ක් ලෙස සංශෝධනය කෙරෙනු ඇත.

- වෘත්තීය ආදායම මත වෙනස් අනුපාත අදාළ කර ගැනීමේ විෂමතාවය ඉවත් කිරීම සඳහා එම ආදායම මත බදු අනුපාතය පහත පරිදි අඩු කරනු ඇත.

| වෘත්තීය සේවා ආදායම් | උපරිම බදු අනුපාතය |
|---|---|
| මිලියන 25 ට අඩු | සියයට 12 |
| මිලියන 25 සිට මිලියන 35 | සියයට 14 |
| මිලියන 35 ඉක්මවන විට | සියයට 16 |

- වෘත්තියෙකුගේ සේවා ආදායම මත පැනවෙන උපරිම ආදායම් බදු අනුපාතය සියයට 16 දක්වා අඩු කරන ලදී.
- ආදායම මිලියන 5 නොඉක්මවන අඩු බදු අනුපාතයක් සහිත සමාගම් සඳහා අදාළ වන සහනදායී බදු අනුපාතය ඉවත් කෙරෙනු ඇත.

- බදු විරාම හා සුදුසුකම් ලබන දීමනා සඳහා අදාල වන සීමා කිරීම් පහත පරිදි වේ.
  - දේශීය ආදායම් පනතේ පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත යම් සමාගමක බදු නිදහස් කිරීම 2014.04.01 ට පෙර කරනු ලැබුවා වූ ආයෝජනවලට සීමාකෙරේ.
  - දැනට පවත්නා ව්‍යවසායයන් සඳහා ව්‍යාපාර පුළුල් කිරීම යටතේ කර ඇති ආයෝජන වෙනුවෙන් සුදුසුකම් ලබන දීමනා අඩු කිරීම් 2014.04.01 දිනට පෙර කරන ලද ආයෝජනයන් සඳහා සීමාකෙරේ.
  - "විධායක නිලධාරියා" යන්න අර්ථ නිරූපණය සඳහා මාසික මුළු පාරිශ්‍රමිකය රුපියල් 25,000 සිට රුපියල් 75,000 දක්වා වැඩි කෙරේ.

**රාජ්‍ය වියදම**

2013 ජනවාරි 01

- 2004 ට පෙර විශ්‍රාම ලැබූ රජයේ සේවකයන් සඳහා විශේෂ දීමනාව මසකට රුපියල් 2,500 දක්වා රුපියල් 750 කින් ද 2005 සිට 2006 දක්වා විශ්‍රාම ලැබූවන් සඳහා විශේෂ දීමනාව මසකට රුපියල් 1,500 දක්වා රුපියල් 500 කින් ද වැඩි කරන ලදී. යෝජිත දීමනාවෙන් සියයට 50 ක් 2013 ජනවාරි මස සිට ලබාදුන් අතර ඉතිරිය 2013 ජූලි මස සිට ලබාදෙන ලදී.
- 2013ට පෙර විශ්‍රාම ලැබූ සියලුම විශ්‍රාමිකයින් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 3,175 දක්වා රුපියල් 500 කින් වැඩි කරන ලදී.
- සියලුම රජයේ සේවකයින් සඳහා වන ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 6,600 දක්වා රුපියල් 750 කින් වැඩිකරන ලදී.

2013 මැයි 01

- සියලුම රජයේ සේවකයින් සඳහා අවමය මසකට රුපියල් 750 සහ උපරිමය මසකට රුපියල් 2,500 වන පරිදි මූලික වැටුපෙන් සියයට 5 ක විශේෂ දීමනාවක් ලබාදෙන ලදී. මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා යෝජිත වැඩිවීමෙන් සියයට 50 ක් 2013 මැයි සිට ලබාදුන් අතර ඉතිරිය 2013 සැප්තැම්බර් සිට ලබාදෙන ලදී. මාණ්ඩලික නිලධාරීන් සඳහා යෝජිත වැඩිවීමෙන් සියයට 50 ක් 2013 ජූලි සිට ලබාදුන් අතර ඉතිරිය 2013 ඔක්තෝබර් සිට ලබාදෙන ලදී.

2014 ජනවාරි 01

- සියලුම රජයේ සේවකයන් සඳහා ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 7,800 ක් දක්වා රුපියල් 1,200 කින් වැඩි කරන ලදී.
- 2006 ට පෙර විශ්‍රාම ලැබූවන් සඳහා ජීවන වියදම් දීමනාව මසකට රුපියල් 3,675 දක්වා රුපියල් 500 කින් සහ අනෙකුත් විශ්‍රාමිකයින් සඳහා මසකට රුපියල් 3,525 දක්වා රුපියල් 350 කින් ද වැඩි කරන ලදී.

**රාජ්‍ය ණය කළමනාකරණය**

2013 ජනවාරි 24

- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු සීමාව එ.ජ.ඩොලර් මිලියන 750 සිට එ.ජ.ඩොලර් මිලියන 1,000 දක්වා වැඩි කරන ලදී.

| | | |
|---|---|---|
| 2013 ජූලි 10 | - | ලැයිස්තුගත කරන ලද කොටස්, ලැයිස්තුගත කරන ලද ණයකර හෝ බැඳුම්කර සහ ලැයිස්තුගත කරන ලද වාණිජ පත්‍රවල මුළු ආයෝජනයෙන් සියයට 5 ක සීමාවක් දක්වා ආයෝජනය කිරීමට අවසර ලබාදීම තුළින් සංස්ථාපිත බැඳුම්කර හෝ ණයකර වෙළෙඳපොළ නිර්මාණකරුවන් ලෙස ක්‍රියා කිරීමට ප්‍රාථමික අලෙවිකරුවන්ට අවසර ලබාදෙන ලදී. |
| 2013 ජූලි 11 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු සීමාව එ.ජ.ඩොලර් මිලියන 1,000 සිට එ.ජ.ඩොලර් මිලියන 1,500 දක්වා වැඩි කරන ලදී. |
| 2013 අගෝස්තු 01 | - | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත යටතේ පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. (Pan Asia Banking Corporation PLC) ප්‍රාථමික අලෙවිකරුවෙක් ලෙස පත්කරන ලදී. |
| 2013 සැප්තැම්බර් 18 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු සීමාව එ.ජ.ඩොලර් මිලියන 1,500 සිට එ.ජ.ඩොලර් මිලියන 2,250 දක්වා වැඩි කරන ලදී. |
| 2013 සැප්තැම්බර් 30 | - | ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ සීමාසහිත හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැංකින් කෝපරේෂන් (Hong Kong & Shanghai Banking Corporation Ltd.) සමාගම සහ සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් (Perpetual Treasuries Ltd.) සමාගම ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලදී. |
| 2013 නොවැම්බර් 07 | - | ප්‍රාථමික අලෙවිකරුවන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර ස්ථාවර සම්බන්ධතාවයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ගනුදෙනුකාර ප්‍රඥප්තිය හඳුන්වා දෙන ලදී. |
| 2013 දෙසැම්බර් 26 | - | ප්‍රාථමික වෙන්දේසීන්හි අනුමත කරන ලද සහ ස්ථිර කරන ලද සාර්ථක ලංසු තැබීමේ වටිනාකම දක්වා තම සන්තකයේ නොමැති භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර විකිණීමේ කටයුතුවල නිරත වීමට ප්‍රාථමික අලෙවිකරුවන්හට අවසර ලබා දී ඇත. |

## මුදල් අංශය

| | | |
|---|---|---|
| 2013 මැයි 10 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.00 සහ සියයට 9.00 දක්වා පදනම් අංක 50 බැගින් අඩුකරන ලදී. |
| 2013 ජූනි 01 | - | ප්‍රතිවිකුණුම් වෙන්දේසි පිරිනමන දිනයන්හිදී නිත්‍ය පහසුකම යටතේ ප්‍රතිමිලදී ගැනුම් මත පැවති රුපියල් මිලියන 100 සීමාව ඉවත් කරන ලදී. |
| 2013 ජූලි 01 | - | ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 06 දක්වා ප්‍රතිශතාංක 02 කින් අඩු කරන ලදී. |
| 2013 ජූලි 24 | - | දැනට පවතින විවෘත වෙළෙඳපොළ කටයුතු යටතේ එක්දින වෙන්දේසි එදිනම (T+0) පියවෙන පරිදි එම වෙන්දේසිවල කල්පිරීමේ කාලය සතියක් දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව, වෙන්දේසි නිවේදනය කිරීම සහ පියවීම එදිනම (T+0) සිදුවන අතර වෙන්දේසි පවත්වනු ලබන කාලසීමාව නොවෙනස්ව පවතී. |
| 2013 අගෝස්තු 30 | - | මෝටර් රථ ආනයනය සඳහා (බස් රථ, ගිලන් රථ, ලොරි සහ ට්‍රක් රථ හැර) වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේ දී සියයට සියයක අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවයක් පනවන ලදී. |
| 2013 ඔක්තෝබර් 15 | - | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.50 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50 බැගින් අඩුකරන ලදී. |
| 2014 ජනවාරි 02 | - | වර්තමාන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව වෙනුවට නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පිහිටුවන ලදී.<br>- වර්තමාන නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම නිත්‍ය තැන්පතු පහසුකම (Standing Deposit Facility) ලෙස නැවත නම් කරන ලද අතර බැංකු පද්ධතියෙහි අතිරික්ත අරමුදල් දෛනික පදනම මත තැන්පත් කිරීම සඳහා වන අනුපාතිකය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (Standing Deposit Facility Rate) වේ. |

- වර්තමාන නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම, නිත්‍ය ණය පහසුකම (Standing Lending Facility) ලෙස නැවත නම් කරන ලද අතර, බැංකු පද්ධතියෙහි දෛනික පදනම මත අරමුදල් ලබාදීමේ අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (Standing Lending Facility Rate) වේ.
- නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලද අතර එමගින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව පැවති පදනම් අංක 200 සිට පදනම් අංක 150 දක්වා සංකෝචනය කරන ලදී.

- මෝටර් රථ ආනයනය සඳහා (බස් රථ, ගිලන් රථ, ලොරි රථ සහ ට්‍රක් රථ හැර) වාණිජ බැංකු සමග ණයවර ලිපි විවෘත කිරීමේ දී සියයට සියයක අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

2014 පෙබරවාරි 01 - මහ බැංකුව සමඟ කරනු ලබන රුපියල් ගනුදෙනු සඳහා පවතින්නේ ශුන්‍ය ණය අවදානමක් බැවින් විවට වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ට මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ සුරැකුම් ලබාදීම අත්හිටුවන ලදී.

## මූල්‍ය අංශය

**ලියාපදිංචි බැංකු**

2013 ජනවාරි 02 - වාණිජ බැංකු විසින් දෛනිකව පවත්වාගෙන යා හැකි ශුද්ධ විදේශ වත්කම් එකතුව එ.ජ.ඩොලර් මිලියන 120 දක්වා වෙනස් කරන ලදී. (ධන හෝ ඍණ අගයක්)

2013 පෙබරවාරි 11 - නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සැකසීම, ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා නව ආකෘතීන් නියම කරන ලද අතර, එමගින් පවත්නා ආකෘතීන් ප්‍රතිස්ථාපනය කරනු ලැබීය.

2013 පෙබරවාරි 14 - නියම කරන ලද අවම ප්‍රාග්ධනය පවත්වා ගැනීමෙන් තොරව බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රාථමික අලෙවිකරු බලපත්‍රය ලබාගැනීම සඳහා අයදුම් කිරීමට අවසර ලබා දෙන ලදී.

2013 අප්‍රේල් 04 - කොටස් වෙළෙඳපොළට වන නිරාවරණයවීම් හේතුවෙන් පැන නැගිය හැකි අවදානම් අවම කිරීම සඳහා විචක්ෂණශීලී අභ්‍යන්තර සීමාවන් වැනි සුදුසු අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ප්‍රමිති පිහිටුවන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් නිකුත් කරන ලදී. අදාළ අවදානම් කළමනාකරණ ප්‍රමිති සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට ප්‍රථම බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒවා අනුමත කළයුතු බවටත් ඒවාට අදාළ තොරතුරු පදනම් කරගෙන එම ප්‍රමිති සහ ප්‍රතිපත්ති නිරන්තර ඇගයීමට ලක් කළයුතු බවටත් උපදෙස් දෙන ලදී.

- මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සතු නිශ්චල දේපළ එහි වෙළෙඳපොළ වටිනාකමට වඩා අඩු අගයකට විකිණීම, හුවමාරු කිරීම, පැවරීම හෝ ඉවත්කිරීම හෝ එවැනි වත්කමක අගය එහි වෙළෙඳපොළ වටිනාකම ඉක්මවන වටිනාකමක් දක්වා ඉහළ නැංවීම වලකාලමින් පැවති පූර්ව විධානයන් සංශෝධනය කර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය යටතේ එම කාර්යයන් සිදුකිරීමට බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අවසර ලබාදෙන ලදී.

2013 අප්‍රේල් 05 - බලපත්‍රලාභී බැංකු විසින්, ඉස්තරම් ඒකක භාරයන්හි (Gilt Unit Trusts) සිදුකර ඇති ආයෝජනයන්, කොන්දේසිවලට යටත්ව අදාළ බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය ගණනය කිරීමේ දී ද්‍රවශීල වත්කම් ලෙස සැලකිය හැකි බව නිර්ණය කරන ලදී.

2013 අප්‍රේල් 12 - බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලැබීම සඳහා, විශේෂිත ව්‍යාපාරික ඒකක ලෙස වර්ගීකරණය කර ඇති ආයතන 10කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු නොකළ යුතු බව දක්වමින් පැවති සීමාවන් ඉවත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ විධානයන් සංශෝධනය කරන ලදී.

| | | |
|---|---|---|
| 2013 අප්‍රේල් 17 | - | 2013-2015 දක්වා කාලසීමාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ලබාගන්නා එ. ජ. ඩොලර් මිලියන 50 ක් දක්වා වන විදේශ ණය, විදේශීය අරමුදල් මුළු ප්‍රාග්ධන අරමුදලේ ප්‍රතිශතයක් ලෙස පැවතිය යුතු සියයට 15 ක සීමාවෙන් නිදහස් කරන ලදී. තවද, උක්ත අරමුදල් උපයෝගී කර ගනිමින් කෘෂිකාර්මික නොවන අංශයන් වෙත අදාළ බැංකු විසින් ලබාදෙන ණය පහසුකම් කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් වන අනිවාර්ය ණය පහසුකම් ගණනය කිරීමේ දී ඉවත් කිරීමට අවසර දෙන ලදී. |
| 2013 අප්‍රේල් 24 | - | ආයෝජන අරමුදල් ගිණුමෙන් (IFA) ණය ලබාදෙන අංශ පුළුල් කරමින් එම ගිණුමෙහි ඇති අරමුදල් භාවිතා කොට අඩු පිරිවැය නිවාස ඉදිකිරීම් ඉලක්ක කොටගත් නිවාස සංවර්ධන ව්‍යාපෘති, තිරසාර බලශක්ති ප්‍රභවයන්හි සිදුකරන ආයෝජන සහ කාන්තා ව්‍යවසායකත්ව ව්‍යාපාර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ණය සහ අත්තිකාරම් ලබාදීමට අවසර දෙන ලදී. |
| 2013 අප්‍රේල් 30 | - | කෘෂිකාර්මික අංශය සඳහා වන අනිවාර්ය ණයදීම් සම්බන්ධයෙන් පැවති උපදෙස් පහත සඳහන් දෑ අන්තර්ගත කරමින් සංශෝධනය කරන ලදී.<br><br>- කෘෂිකාර්මික අංශය වෙත ණයදීම සඳහා බැංකු විසින් අනෙකුත් බැංකු සහ මූල්‍ය සමාගම් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම්, අදාළ බැංකුවල එවැනි ණය පහසුකම් නිවැරදිව හඳුනාගැනීමට සුදුසු අධීක්ෂණ ක්‍රමවේදයක් පවත්වාගෙන යන අවස්ථාවන්හිදී පමණක්, එවැනි ණය බලපත්‍රලාභී බැංකු විසින් කෘෂිකාර්මික අංශය වෙත ලබාදුන් අනිවාර්ය ණය ලෙස සැලකීමට අවසර ලබාදෙන ලදී.<br><br>- දේශීය කෘෂිකාර්මික නිෂ්පාදිත භාවිතා කරමින් නිෂ්පාදන ව්‍යාපාරවල නියුතු සමාගම් සහ කෘෂිකාර්මික අංශයේ අතරමැදිකරණයේ නියුතු ආයතනවලට බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකම් ඉහත වර්ගීකරණය සඳහා ඇතුළත් කිරීමට අවසර ලබා දෙන ලදී.<br><br>- ශ්‍රී ලංකාවෙන් පිටතදී ආයතන හා පුද්ගලයන් වෙත බලපත්‍රලාභී බැංකුවල අක්වෙරළ බැංකු ඒකක/විදේශීය ශාඛා විසින් ප්‍රදානය කරන ලද ණය හා අත්තිකාරම් ද, රජය මගින් සිදු කරන හා රජය විසින් අනුග්‍රහය දක්වන අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඍජු ණය හා අත්තිකාරම් ද, කෘෂිකාර්මික අංශයට ලබාදුන් අනිවාර්ය ණය ගණනය කිරීමේ දී අන්තර්ගත නොකිරීමට තීරණය කරන ලදී. |
| 2013 මැයි 01 | - | බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සංචිත ගණනය කරනු ලබන සහ පවත්වා ගනු ලබන කාලපරිච්ඡේද පහත පරිදි සංශෝධනය කරන ලදී.<br><br>- සෑම මාසයක්ම කාලපරිච්ඡේද 2 කට බෙදා ඇත. (එනම් "අ" කාලපරිච්ඡේදය සහ "ආ" කාලපරිච්ඡේදය)<br><br>- "අ" කාලපරිච්ඡේදය : 01 වන දින සිට 15 වන දින දක්වා (දෙදිනම ඇතුළත්ව) ; සහ<br><br>- "ආ" කාලපරිච්ඡේදය : 16 වන දින සිට මාසයේ අවසන් දිනය දක්වා (දෙදිනම ඇතුළත්ව)<br>ඕනෑම මාසයක "අ" කාලපරිච්ඡේදයට අදාළව වාණිජ බැංකු විසින් පවත්වාගත යුතු සංචිත අවශ්‍යතාවය ඊට පෙර මාසයේ "අ" කාලපරිච්ඡේදයේ දෛනික තැන්පතු වගකීම්වල සාමාන්‍ය මත පදනම් විය යුතු අතර, ඕනෑම මාසයක "ආ" කාලපරිච්ඡේදයට අදාළව පවත්වාගත යුතු සංචිත අවශ්‍යතාවය ඊට පෙර මාසයේ "ආ" කාලපරිච්ඡේදයේ දෛනික තැන්පතු වගකීම්වල සාමාන්‍ය මත පදනම් විය යුතුය. |
| 2013 මැයි 31 | - | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමේ අරමුණෙන් ලංකාක්ලියර් පුද්ගලික සමාගමට සහ සාමාජික බැංකු වෙත, 2013 අංක 01 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2013 ජූනි 07 | - | 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග ප්‍රතිස්ථාපනය කරමින් 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග නිකුත් කරන ලදී. |

| | |
|---|---|
| | - ණය ආශ්‍රිත අත්තිකාරම් සඳහා අය කරන වාර්ෂික පොලී අනුපාතය සියයට 28 සිට සියයට 24 දක්වා ද, අනෙකුත් සියලුම ණය සහ අත්තිකාරම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතයන් එහි පවත්නා මට්ටමේ සිට වසරකට සියයට 24 නොඉක්මවන මට්ටමක් දක්වා ද, අඩු කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දන්වන ලදී. |
| 2013 ජුනි 12 | - බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතු ඇපයට ගෙන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙත මූල්‍ය අනුග්‍රහ ලබාදීම වලකාලමින් පැවති සීමාවන් ඉවත් කෙරිණි. |
| 2013 ජූලි 02 | - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදුකරන ගනුදෙනු සඳහා කාඩ්පත් නිකුත් කරන්නෙකු විසින් ගනුදෙනුකරුවකුගෙන් අයකර ගතහැකි ගාස්තුව සහ මූල්‍ය අත්පත්කරුවෙකු විසින් කාඩ්පත් නිකුත් කරන්නකුගෙන් අය කළ හැකි අන්තර් හුවමාරු ගාස්තුව පිළිබඳ උපරිම සීමාවන් පැනවීම සඳහා 2013 අංක 02 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2013 ජූලි 26 | - දැනටමත් ලබාදී ඇති ණය පහසුකම් ඇතුළුව සියලුම ණය හා අත්තිකාරම් ණය හිඟ හිටි කාලසීමාව තුළ, හිඟහිටි මුදල මත අයකරන දඩ පොලී අනුපාතය සියයට 2ක වාර්ෂික අනුපාතයක් නොඉක්මවන මට්ටමකට අඩුකරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට දන්වන ලදී. |
| 2013 ජූලි 31 | - බාසල් II - දෙවැනි ආධාරකය වන අධීක්ෂණ විමසුම් ක්‍රියාවලියට අනුකූලව නිකුත් කරන ලද විධානයන්ට අනුව අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියක් ක්‍රියාවට නංවන ලෙස සහ සියලු අවදානම්වලට නිරාවරණය වීම් ආවරණය කිරීම සඳහා පළමුවන ආධාරකය යටතේ වන අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මවා ප්‍රාග්ධනය පවත්වා ගන්නා ලෙස බලපත්‍රලාභී බැංකුවලට දන්වන ලදී. |
| 2013 සැප්තැම්බර් 17 | - විගණනය කරන ලද වාර්ෂික වාර්තා/මූල්‍ය ප්‍රකාශන, කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව යටතේ ඉදිරිපත් කළ යුතු බැංකුවල අවදානම් කළමනාකරණයට අදාළ ගුණාත්මක හෙළිදරව් කිරීම් තම වෙබ් අඩවිවල පළ කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට දන්වන ලදී. |
| 2013 නොවැම්බර් 08 | - 2008.11.06 වැනි දින නිකුත් කළ චක්‍රලේඛයට අවනත වෙමින්, නොමග යවනසුළු සහ වෘත්තිමය වශයෙන් ආචාර සම්පන්න නොවන දැන්වීම් පළ කිරීමෙන් වළකින ලෙසත්, සියලු වැදගත් තොරතුරු වෙත නිසි ප්‍රමුඛතාවය ලබාදෙන ලෙසත් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙන ලදී. |
| 2013 නොවැම්බර් 22 | - මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම ප්‍රකාශයට පත්කරන ලදී.<br>- ප්‍රධාන සමාගම යටතේ පවත්වාගෙන යනු ලබන අනුබද්ධිත මූල්‍ය සමාගම්වල මෙහෙයුම් කටයුතු ප්‍රධාන සමාගම සමග ඒකාබද්ධ කිරීම.<br>- බැංකු යටතේ පවත්වාගෙන යනු ලබන මූල්‍ය සමාගම්වල මෙහෙයුම් කටයුතු එම බැංකු හා ඒකාබද්ධ කරන අතර තවදුරටත් බැංකු ශක්තිමත් කිරීමට දිරිගැන්වීමක් වශයෙන් අත්පත් කර ගැනීමේ දී කරනු ලබන ආයෝජන වියදම් බදු අයකරන ආදායම ගණනය කිරීමේ දී අඩු කළ හැකි වියදමක් ලෙස සැලකීම<br>- සංවර්ධන බැංකු ඒකාබද්ධ කිරීමට දිරිමත් කිරීම. |
| 2013 දෙසැම්බර් 04 | - ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක සඳහා අවසර ලබා දෙන ලදී.<br>- ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සිදුකළ ආයෝජන බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය ගණනය කිරීමේදී ද්‍රවශීල වත්කම් ලෙස සැලකීමට තීරණය කරන ලදී. |

| | | |
|---|---|---|
| 2013 දෙසැම්බර් 30 | - | ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතියෙහි කරන ලද තාක්ෂණික වැඩිදියුණු කිරීම්වල ප්‍රතිලාභ බැංකු ගනුදෙනුකරුවන් වෙත ලබාදීමේ අරමුණින් 2007 අංක 01 දරන ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය යටතේ ගනුදෙනුකරුවන්ගෙන් චෙක්පත් තැන්පතු භාරගැනීම සහ චෙක්පත්වලට අදාළ අරමුදල් ගනුදෙනුකරුවන්ගේ ගිණුම්වලට බැරකිරීම සඳහා සහභාගිත්ව ආයතනවලට අදාළ සම්මත වේලාවන් සහ සේවා නියමයන් පිළිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරමින් 2013 අංක 03 දරන චෙක්පත් තැන්පතු භාරගැනීම සහ චෙක්පත්වලට අදාළ අරමුදල් බැරකිරීම සඳහා අදාළ සේවා නියමයන් සහ සම්මත වේලාවන් පිළිබඳ පොදු විධිවිධාන නිකුත් කරන ලදී. |
| **අපේක්ෂිත** | | |
| | - | බාසල් II පළමු වැනි ආධාරකය යටතේ වන උසස් ප්‍රවේශයන් තවදුරටත් ක්‍රියාවට නැංවීම. |
| | - | බාසල් III ප්‍රාග්ධන ප්‍රමිතීන්ට අනුකූලව සුදුසු නියාමන රෙගුලාසි හඳුන්වාදීම. |
| | - | බැංකු සමූහ පිළිබඳ ඒකාබද්ධ අධීක්ෂණය සඳහා සවිස්තරාත්මක අධීක්ෂණ රාමුවක් ක්‍රියාත්මක කිරීම. |
| | - | සාර්ව විචක්ෂණ දර්ශක විශ්ලේෂණය අඛණ්ඩව සිදුකිරීම සහ වත්කම් වෙළෙඳපොළ කෙරෙහි බැංකු අංශයේ නිරාවරණයවීම්, අනෙකුත් විභව ආර්ථික කම්පනයන් සහ සංකේන්ද්‍රණයවීම් හේතුවෙන් හටගන්නා අවදානම් නිරීක්ෂණය කරන අවස්ථාවන්හිදී සුදුසු විචක්ෂණශීලී නියාමන රෙගුලාසි නිකුත් කිරීම. |
| | - | බැංකුවල ආතති පරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් මාලාවක් නිකුත් කිරීම. |
| | - | නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පවත්නා නියාමන රාමුවට සුදුසු වෙනස්කිරීම් අඛණ්ඩව සිදුකිරීම.<br>- නව දුරස්ථ සුපරීක්ෂණ වාර්තා පද්ධතියක් හඳුන්වාදීම.<br>- පවත්නා විධානයන් සහ අනෙකුත් රෙගුලාසි සංශෝධනය කිරීම. |
| | - | කේන්ද්‍රීය බැංකුකරණ පද්ධති සහ බැංකු විසින් භාවිතා කරනු ලබන අනෙකුත් තොරතුරු තාක්ෂණය පදනම් කරගත් පද්ධතීන් සම්බන්ධයෙන් තහවුරු කළයුතු අවම ප්‍රමිතීන් ස්ථාපිත කිරීම. |
| **අනෙකුත් මූල්‍ය ආයතන** | | |
| 2013 මැයි 15 | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) අංක 07 ට අදාළව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2013 ජූනි 07 | - | මූල්‍ය අංශයේ වර්තමාන වර්ධනයන්ට අනුකූලවන ලෙස මුදල් සමාගම් (ව්‍යුහාත්මක වෙනස්කම්) විධානය සංශෝධනය කරන ලදී. |
| 2013 ජූලි 26 | - | මුදල් සමාගම් විසින් සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබාදෙන ලද ණය පහසුකම් කපාහැරීම සඳහා මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුයැයි පැවති අවශ්‍යතාවය, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු ලෙස සංශෝධනය කරන ලදී. |
| | - | බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නිකුත් කරනු ලබන ණය සාධන පත්‍ර සම්බන්ධව, විශේෂයෙන් ද්‍රවශීලතාව හා පොලී/කූපන් අනුපාත සඳහා අධීක්ෂණ රාමුවක් හඳුන්වා දෙන ලදී. |
| 2013 සැප්තැම්බර් 07 | - | ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දෙන ලියාපදිංචි මුදල් සමාගම්වලට ආධාර කිරීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාර වැඩසටහන යටතේ ද්‍රවශීලතා ආධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. |
| 2013 සැප්තැම්බර් 17 | - | ආයතනික යහපාලන විධානයේ, අනාවරණ විධිවිධාන කිහිපයක් සංශෝධනය කිරීම සඳහා ආයතනික යහපාලන (සංශෝධනය) විධානය නිකුත් කරන ලදී. |
| 2013 දෙසැම්බර් 05 | - | 2014.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි, තැන්පතු සහතික ද ඇතුළත්ව පොලී ගෙවීම් අදාළ වන ඉතුරුම් හා කාලීන තැන්පතු සඳහා පොලී නොවන දිරිගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොකරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම්වලට නියම කරන ලදී. |

| | | |
|---|---|---|
| 2013 දෙසැම්බර් 18 | - | බලපත්‍රලාභී මුදල් සමාගමක් බලපත්‍රය ලබා ගන්නා වර්ෂය තුළ දී ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු වැඩි කරන ලදී. |
| **අනෙකුත්** | | |
| 2013 ජනවාරි 01 | - | වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහායවීමේ සහ හවුල්වීමේ චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. |
| 2013 ජනවාරි 31 | - | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 02(3) වගන්තිය යටතේ විදේශ මුදල් හුවමාරු කිරීමට බලයලත් සියලුම සමාගම් වෙත ගනුදෙනුකරු හඳුනාගැනීමේ (KYC) සහ ගනුදෙනුකරු පිළිබඳ විචක්ෂණශීලීබවින් යුක්තව ක්‍රියාකිරීමේ (CDD) නීති නිකුත් කරන ලදී. |
| 2013 පෙබරවාරි 12 | - | 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත 2013 අංක 03 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී. |
| 2013 පෙබරවාරි 15 | - | ශ්‍රී ලංකාවේ මුදල් තැරැව්කරණ ව්‍යාපාරය නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2013 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසිය නිකුත් කරන ලදී. |
| | - | අවසරලත් මුදල් තැරැව්කරණ සමාගම් විසින් ගෙවිය යුතු වාර්ෂික සහතික පත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාර්ගෝපදේශයන් නිකුත් කරන ලදී. |
| 2013 මාර්තු 14 | - | දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වන නුබුන්වත් ආන්තික රෙගුලාසිවලට අදාළව ශ්‍රී ලංකාවේ ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීමේ දී තක්සේරුකරුවෙකු විසින් සැලකිය යුතු විශේෂිත නිර්ණායක ඇතුළත් චක්‍රලේඛයක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සියලුම රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2013 අප්‍රේල් 26 | - | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - අදියර II - චක්‍රීය අරමුදල ණය යෝජනා ක්‍රමය (PAMP II - RF) ආරම්භ කරන ලදී. |
| 2013 මැයි 02 | - | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පහත පරිදි වැඩි කරන ලදී.<br>- 2011 ජුනි 30 දින හෝ එදිනට පෙර ලියාපදිංචි වූ සියලුම රක්ෂණ සමාගම් ඒවායේ සෑම රක්ෂණ ව්‍යාපාර අංශයක් සඳහාම වන අවම ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය 2015 වසරේ පෙබරවාරි 11 දින හෝ එදිනට පෙර රුපියල් මිලියන 500 දක්වා වැඩිකිරීම.<br>- සියලුම ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් ඒවායේ අවම ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය 2014 දෙසැම්බර් 31 දිනට හෝ එදිනට පෙර රුපියල් මිලියන 2.5 දක්වා ඉහළ දැමීම. |
| 2013 මැයි 14 | - | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍ර මූල්‍ය කොටස හැර අනෙකුත් කොටස් ක්‍රියාත්මක කිරීමේ කාර්යය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට පවරන ලදී. |
| 2013 මැයි 23 | - | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය-චක්‍රීය අරමුදල අදියර III ආරම්භ කරන ලදී. |
| 2013 ජුනි 13 | - | කොටස් තැරැව්කරුවන් විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙනුවෙන් හා ඒ සඳහා සිදුකරන ගනුදෙනුවලට අදාළව පනවා තිබූ සීමාවන් ඉවත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නව චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2013 අගෝස්තු 23 | - | මහජනයාට දායක වීම සහ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම යන කොටස් ලැයිස්තුගත කිරීමේ ක්‍රමයන් මාර්ගයෙන් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමට අපේක්ෂා කරන පොදු සමාගමකට අදාළ වන නව ලැයිස්තුගත කිරීමේ නියාමන හඳුන්වා දෙමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2013 අගෝස්තු 29 | - | සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන ලදී. |

2013 ඔක්තෝබර් 11 - 2012.03.02 දින දී අත්හිටවනු ලැබූ, කොළඹ කොටස් වෙළෙඳපොළේ කොටස් ලැයිස්තුගත කිරීමේ ක්‍රමයක් වන මහජන නිකුතුවක් අවශ්‍ය නොවන හඳුන්වාදීම, ගනුදෙනු නොකර තබාගැනීමේ යාන්ත්‍රණය, සම්බන්ධිත මිල හා අනාවරණ අවශ්‍යතාවයන් යනාදී අනෙකුත් තත්ත්වයන්ගේ සංවර්ධනයන් සහිතව නැවත ස්ථාපනය කරන ලදී.

2013 ඔක්තෝබර් 29 - ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාවට නැංවීමෙන් ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට සහ මැඩපැවැත්වීමට අදාළ වගකීම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත විධාන නිකුත් කරන ලදී.

2013 නොවැම්බර් 04 - ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාවට නැංවීමෙන් ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමට සහ මැඩපැවැත්වීමට අදාළ වගකීම් සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම් වෙත විධාන නිකුත් කරන ලදී.

2013 දෙසැම්බර් 12 - 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලැයිස්තුගත සමාගම්වල සම්බන්ධිත පාර්ශ්වයන්ගේ ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන යෝග්‍ය භාවිතයන් සහිත නීති සංග්‍රහයක් පවත්වාගෙන යාම සඳහා ලැයිස්තුගත සමාගම්වලට නියෝග කරමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී.

2013 දෙසැම්බර් 17 - ඒකක භාර අරමුදල්වල ස්ථාවර සුරැකුම්වලට අදාළව දෛනික තක්සේරුකිරීමේ ක්‍රියාපටිපාටීන් පහත පරිදි හඳුන්වා දෙන ලදී.

- පරිණත කාලය දින 366 නොඉක්මවන කෙටිකාලීන ද්‍රවශීල ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල පමණක් ආයෝජනය කරන සියලුම මුදල් වෙළෙඳපොළ අරමුදල්, පිරිවැයට උපචිත පොලිය එකතු කිරීමෙන් යුතුව තක්සේරුකිරීමේ ක්‍රමය භාවිත කිරීම.
- රාජ්‍ය සුරැකුම්පත් ඇතුළුව අනෙකුත් සියලුම ලැයිස්තුගත නොකළ ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනය කරන සෙසු අරමුදල් වෙළෙඳපොළ අභිමුඛ වූ පදනමක් යටතේ තක්සේරු කිරීම.

2013 දෙසැම්බර් 20 - කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි සමාගම් සඳහා අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවක් ලෙස අවම නිදහස් චලිත අවශ්‍යතාව පහත ආකාරයන්ගෙන් යුතුව හඳුන්වා දෙන ලදී.

- ප්‍රධාන පුවරුවෙහි ලැයිස්තුගත සියලුම සමාගම් විසින් සමස්ත සාමාන්‍ය ඡන්ද කොටස්වලින් සියයට 20 ක අවම නිදහස් චලිත අවශ්‍යතාවක් අවම වශයෙන් කොටස්කරුවන් 750 ක් සතුව පවත්වා ගැනීම හෝ මුලු නිකුතු කොටස්වලින් මහජනයා සතුව සියයට 10ක අවම කොටස් ප්‍රමාණයක් පවත්වා ගනිමින්, සමාගමක මහජනයා සතු කොටස් අයිතියෙන් රුපියල් බිලියන 5 ක වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයක් අවම වශයෙන් මහජන කොටස්කරුවන් 500 ක් සතුව පවත්වා ගෙන යාම.
- දිරිසවි පුවරුවෙහි ලැයිස්තුගත සියලුම සමාගම්, ලැයිස්තුගත කොටස්වලින් සියයට 10 ක් අවම වශයෙන් නිදහස් චලිත අවශ්‍යතාවක් ලෙස මහජන කොටස්කරුවන් 200 කට නොඅඩු සංඛ්‍යාවක් අතර පවත්වා ගත යුතු වීම.

2013 දෙසැම්බර් 27 - කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රෙගුලාසි යටතේ අධ්‍යක්ෂවරුන්ට පමණක් අදාළ වූ කොටස් ගනුදෙනු කිරීමේ දී තිබෙන අනාවරණ අවශ්‍යතාවයන් පුළුල් කරමින්, ප්‍රධාන විධායක නිලධාරීන්ට ද අදාළ වන පරිදි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විධානයක් නිකුත් කරන ලදී. මෙම විධානය අනුව, 2014.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් කොටස් ගනුදෙනු කිරීම්වලට අදාළ අනාවරණය කිරීම්, ගනුදෙනු කළ දින සිට දින 5 ක් ඇතුළත (T+5) සිදුකළ යුතුය.